අම්බුළුවාව දිසානායක මුදියන්සේලාගේ ජයරත්න ආගමික මධ්‍යස්ථානය සහ ජෛව විවිධත්ව සංකීර්ණ භාර අරමුදල - 2024

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

අම්බුළුවාව දිසානායක මුදියන්සේලාගේ ජයරත්න ආගමික මධ්‍යස්ථානය සහ ජෛව විවිධත්ව සංකීර්ණ භාර අරමුදලේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2009 අංක 44 දරන අම්බුළුවාව දිසානායක මුදියන්සේලාගේ ජයරත්න ආගමික මධ්‍යස්ථානය සහ ජෛව විවිධත්ව සංකීර්ණ භාර අරමුදල් පනතේ 10(4) වගන්තිය, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනත සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

	අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි ඡේද අංක 55 ප්‍රකාරව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන අයිතමයන් නැවත වර්ගීකරණය කරනු ලබන අවස්ථාවක ප්‍රමිතය ප්‍රකාරව ඒ සම්බන්ධ තොරතුරු මූල්‍ය ප්‍රකාශන තුල අනාවරණය කළ යුතු විය. ඉදිකරමින් පවතින කේබල් කාර් ව්‍යාපෘතිය සඳහා ඉකුත් වර්ෂයේ වැය කරන ලද රු.5,372,320 ක මුදල ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල නොනිම් ඉදිකිරීම් ලෙස දක්වා තිබුණු අතර, එම මුදලද ඇතුළත්ව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට ව්‍යාපෘතිය සඳහා දරා ඇති රු.93,680,989 ක මුළු මුදල ආයෝජන ලෙස සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. එහෙත් නැවත වර්ගීකරණයට අදාල තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.	කේබල් කාර් ව්‍යාපෘතිය ගිවිසුම් ප්‍රකාරව ඉදිකිරීම් යටතට අයත් නොවන අතර එය භාර අරමුදලේ සියයට 14 ආයෝජන වන බැවින් මූල්‍ය ප්‍රකාශන අයිතම වර්ගීකරණය නිවැරදි කරන බව.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත අනුව කටයුතු කළ යුතුය.

1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ සේවක අර්ථසාධක අරමුදල් හා සේවක භාරකාර අරමුදල් වියදමේ එකතුව රු.2,293,901 වුවද, මූල්‍ය ප්‍රකාශනවල එය රු.1,305,285ක් ලෙස රු.988,616 ක් අඩුවෙන් දක්වා තිබුණි.	2024 වර්ෂයේදි මූලික වැටුප පදනම් කරගෙන දායක මුදල් ගෙවන ලද අතර මේ පිළිබඳව පරීක්ෂා කර පිළිතුරක් ලබා දෙන ලෙස කම්කරු	විධිමත් පරිදි පරීක්ෂා කර නිවැරදි වටිනාකම මූල්‍ය ප්‍රකාශනයට ඇතුළත් කළ යුතුය.

		දෙපාර්තමේන්තුවෙන් විමසා ඇති බව.	
(ආ)	අම්බුළුවාව පරිශ්‍රයේ මෙහෙයුම් කටයුතු වෙනුවෙන් ස්ථාපිත පරිගණක පද්ධතිය අනුව, සමාලෝචිත වර්ෂයේ එක් එක් සිහිවටන වර්ගය අනුව මුළු සිහිවටන අලෙවි ආදායම හා මාසික සාරාංශ අනුව සිහිවටන අලෙවි ආදායම අතර රු.1,604,777 ක නොසැසඳීමක් පැවතුණි.	එහි තිබූ වරද නිවැරදි කර ඇති බව.	මෙවැනි තත්ත්වයක් ඇති නොවන ලෙසට අභ්‍යන්තර පාලනයන් ශක්තිමත් කිරීමට කටයුතු කළ යුතුය.
(ඇ)	සමාලෝචිත වර්ෂයේ ආදායම හඳුනා ගැනීමේදී Adventure Park හා Souvenir Shop ආදායම රු.116,250 කින් අඩුවෙන් දක්වා තිබුණි.	ගණනය කිරීමේ දෝෂයක් හේතුවෙන් පිළිවෙලින් 96,250 හා 20,000 ක් අඩුවෙන් සටහන් වී ඇති බව.	නිවැරදි වටිනාකම මූල්‍ය ප්‍රකාශනයට ඇතුළත් කිරීමට පියවර ගත යුතුය.
(ඇ)	පයිනස් වගාව තුළ ගැලවී ඇති ගස්වලින් දික් අඩි 14,744 ක් සහ වර්ග අඩි 5,797 ක් හා දිග ප්‍රමාණය සඳහන් නොවූ, දැව ඉරීම සඳහා එකතුව රු.1,000,070 ක් ගෙවීම් කර තිබූ නමුත් ඉරන ලද දැව සඳහා දරන ලද වියදමෙන් රු.288,180 ක් වූ වටිනාකම පමණක් මූල්‍ය ප්‍රකාශනවල තොගය ලෙස සඳහන් කර ඉතිරි රු.711,890 ක මුදල රංග පීඨයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. වර්ෂාවසානයේ ඉතිරිව පැවති ලී දික් අඩි 7015 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.	පයිනස් වගාව තුළ ගැලවී ඇති ගස් වලින් ලබා ගත් දැව වටිනාකම ගණනය කර සංශෝධිත ගිණුම් ප්‍රකාශනය නිවැරදි කරන බව.	නිවැරදි වටිනාකම මූල්‍ය ප්‍රකාශනයට ඇතුළත් කිරීමට පියවර ගත යුතුය.

1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

	විෂය	මුදල රු.	නොසැපයූ විගණන සාක්ෂි	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ස්ථාවර වත්කම්	483,501,310	ස්ථාවර වත්කම් ලේඛන	2024-12-31 දිනට වත්කම් ලේඛණය පිළිතුර සමග ඉදිරිපත් කරන බව.	ස්ථාවර වත්කම් ලේඛනය නියමිත ආකෘතිය ප්‍රකාරව සකසා ඉදිරිපත් කළ යුතුය.
(ආ)	ඉන්ධන තොග ශේෂය	142,428	තොග වාර්තාවන්	ඉන්ධන තොගය තහවුරු කිරීමට අදාල වාර්ථා ඉදිරිපත් කරන බව.	තොග වාර්තාවන් විගණනයට ඉදිරිපත් කළ යුතුය.

(ඇ)	ලැබිය යුතු ආදායම්	6,944,247	ශේෂ සනාථන	රු 6,944,247 ණය ගැති කාල විශ්ලේෂණය ඉදිරිපත් කරන බව.	ශේෂ සනාථ කිරීම් විගණනයට ලබා දීමට කටයුතු කළ යුතුය.
(ඈ)	ඉදිකිරීම් හා සැපයීම්	16,196,981	කළ වැඩ වාර්තා, මිලදී ගත් ද්‍රව්‍ය ප්‍රමාණ පත්‍ර, රේට් ආදී තහවුරු ලේඛන	ගෙවීම් සඳහා තහවුරු කිරීම් මීට ප්‍රථම ඉදිරිපත් කර ඇති අතර නැවත මේ සමග ඉදිරිපත් කරන බව.	ශේෂයන් තහවුරු කිරීමට ප්‍රමාණවත් සාක්ෂි වවුචර් සමග ඉදිරිපත් කළ යුතුය.

1.6 ගෙවිය යුතු මුදල්

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2022 හා 2023 වර්ෂයේ සිට පැවත එන එකතුව රු.627,119 ක් වූ ණය හිමි ශේෂ 06 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.	ණය හිමියන් සමග එකඟතාවය මත නිරවුල් කිරීමට කටයුතු යොදා ඇති බව.	ණයහිමි ශේෂයන් කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.

1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2009 අංක 44 දරන අම්බුළුවාව ජෛව විවිධත්ව සංකීර්ණ භාර අරමුදල් පනතේ 6(2)(1)(ඊ) වගන්තිය	කාර්ය මණ්ඩලය හා ඔවුන් බඳවා ගැනීම සම්බන්ධ රීතීන් අනුමත කර ගෙන විධිමත් සංවිධාන ව්‍යුහයක් සැකසීමට හා විධිමත් පරිදි කාර්යය මණ්ඩලයක් බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි.	ඒ සඳහා ඉදිරියේදි කටයුතු කරන බව.	පනතේ නියමයන් ප්‍රකාරව කටයුතු නොකළ නිලධාරීන් සම්බන්ධ පියවර ගැනීමත්, පනතට අනුකූලව කටයුතු කිරීමටත් පියවර ගත යුතුය.
(ආ)	නගර සභා ආඥා පනතේ 255 වන අධිකාරියෙහි 125 වගන්තිය	අම්බුළුවාව පරිශ්‍රයේ ඉදිකර ඇති කාර්යාල සංචාරක බංගලාව, ආපනශාලාව, ආගමික ස්ථාන, වැඩිහිටි නිවාස, පිවිසුම් තොරණ, වැසිකිලි, කුළුණු හා වෙනත් ඉදිකිරීම් වෙනුවෙන් ගම්පොළ නගර සභාවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.	පෙර සිට පැවත එන ගොඩනැගිලි වන අතර ඒ සඳහා අදාල අනුමැතිය ලබා ගැනීමට අදාල ආයතන වලට යොමු කර ඇති බව .	- එම -

(ඇ)	1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත හා 1980 අංක 46 දරන සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් පනත	සමාලෝචිත වර්ෂයේ අරමුදල්වල දායකත්වය ගණනය කිරීමේදී සේවකයාගේ ඉපයීම මත පදනම්ව ගණනය කළ යුතු වුවත්, භාර අරමුදල විසින් සේවකයාගේ මූලික වැටුප මත පමණක් පදනම්ව දායක මුදල් ගණනය කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දායකත්වය රු.1,515,878ක් අඩුවෙන් දක්වා තිබුණ අතර, රු.3,834,574 ක වැටුප් ගෙවූ සේවකයින් 32 ක් සඳහා අරමුදල් දායකත්වය ගෙවා නොතිබුණි.	2024 වසර තුල කොන්ත්‍රාත් පදනම මත සීමිත කාලයකට බඳවා ගන්නා ලද සේවකයින් සඳහා EPF/ETF ගෙවීම කටයුතු නොකරන ලද අතර ස්ථිර සේවකයින් සඳහා EPF/ETF ගෙවීමට කටයුතු කර ඇති බව.	- එම -
(ඈ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය			
i.	මුදල් රෙගුලාසි 371 (2) (අ)	රු.25,000 ක උපරිමයක් දක්වා සුළු මුදල් අග්‍රිම ලබාදිය හැකි වුවත් සමාලෝචිත වර්ෂය තුළ රු.50,000 සිට රු.750,000 දක්වා අවස්ථා 65 කදී සුළු මුදල් අග්‍රිම ලෙස සේවකයින් තුන්දෙනෙකු වෙත රු.12,138,389 ක් නිදහස් කර තිබුණි. එසේම, සුළු මුදල්වලින් එක් වරකදී එක් අවශ්‍යතාවයකට ගෙවිය හැකි උපරිම මුදල රු.5,000 ක් වුවත්, සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 161 කදී ඊට අනුකූල නොවන ආකාරයට රු.5,190 සිට රු.346,880 දක්වා එකතුව රු.4,308,133ක් ගෙවා තිබුණි.	රු. 500,000 කට වැඩි මුදලක් ආවරණ අනුමැතිය යටතේ ලබා ගෙන ඇති බව.	මුදල් රෙගුලාසි නියමයන්ට පටහැනිව කටයුතු කළ නිලධාරීන්ට අදාළ පියවර ගැනීමත්, ඉදිරියේදී මෙවැනි තත්ත්වයක් වළක්වා ගැනීමට විධිමත් පියවර ගැනීමත් කළ යුතුය.
ii.	මුදල් රෙගුලාසි 387	චෙක්පත් මගින් කෙරෙන සියලුම ගෙවීම් සඳහා තම බැංකු ශේෂය ප්‍රමාණවත් දැයි ගෙවන නිලධාරියා විසින් නිතරම සොයා බැලිය යුතු වුවත්, එසේ කටයුතු කිරීමෙන් තොරව ගෙවීම් කර තිබීමෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට	චෙක්පත නිකුත් කර තිබූ නමුත් මෙම වර්ෂය තුල බැංකු අයිරා පහසුකම් ලබා ගැනීමට කටයුතු කර නොමැති බව.	- එම -

		බැංකු ගිණුමක රු.525,452ක අයිරා ශේෂයක් පැවතුණි.		
iii.	මුදල් රෙගුලාසි 396	නිකුත් කරන ලද චෙක්පත්වල වලංගු කාල සීමාව ඉක්මවා ඇති එකතු වටිනාකම රු.24,200ක් වූ චෙක්පත් 03 ක් සම්බන්ධයෙන් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	චෙක්පත් ලාභීන් දැනුවත් කර ඒ සමබන්ධයෙන් විධිමත් පියවරක් ගැනීමට කටයුතු කරන බව.	මුදල් රෙගුලාසි නියමයන් ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ඉ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4 ඡේදය	සමාලෝචිත වර්ෂයේ අම්බුළුවාව ජෛව විවිධත්ව සංකීර්ණයෙහි කටයුතු සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ රෙජිස්ටරය ඉදිරිපත් කරන බව.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ නියමයන් ප්‍රකාරව කටයුතු කර සැපයුම්කරුවන් ලියාපදිංචි කර ගත යුතුය.
(ඊ)	2009 ජූනි 09 දිනැති අංක DMA/2009 (01) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය	අභ්‍යන්තර විගණනයක් ආරම්භයේ සිට මේ දක්වාම පවත්වා නොතිබුණි.	2025 වර්ෂයේ සිට අභ්‍යන්තර විගණනයක් ආරම්භ කිරීමට පියවර ගෙන ඇති බව.	චක්‍රලේඛ නියමයන් ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(උ)	භාර අරමුදල් පාලක මණ්ඩලයේ 2009 ඔක්තෝබර් 02 දිනැති රැස්වීම් වාර්තාව	රැස්වීම් වාර්තාවේ තීරණ අංක 1 ප්‍රකාරව වර්ෂයක් සඳහා පාලක මණ්ඩල රැස්වීම් 12 ක් පැවැත්විය යුතු වුවද 2024 වර්ෂයේදී රැස්වීම් 06 ක් පමණක් පවත්වා තිබුණි.	අවශ්‍යතාවය මත පමණක් භාරකාර මණ්ඩල රැස්වීම පැවැත්වීමට කටයුතු යොදා ඇති බව.	නියමිත රැස්වීම් වාර ගණන පැවැත්වීමට පියවර ගත යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.137,693,888 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.44,632,225 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයේ රු.93,061,663 ක වර්ධනයක් විය. මෙම වර්ධනයට ප්‍රවේශපත් අලෙවි ආදායම හා ගොඩනැගිලි කුලී ආදායම් ඉහළ යාම ප්‍රධාන වශයෙන්ම හේතු වී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශක්‍යතා අධ්‍යයන වාර්තා, සැලසුම් හා ඇස්තමේන්තු සකස් කිරීමෙන් තොරව සංකීර්ණය තුළ ශෛලමය බුදු පිළිමයක් නෙලීම, වාහන නැවතුම්පල 1 හා 2 ඉදි කිරීම සහ Tree Top ව්‍යාපෘතිය ආරම්භ කිරීම වෙනුවෙන් එකතුව රු.10,313,917 ක් වැය කර තිබුණද, 2022 වර්ෂය වනවිට ඒවායේ ඉදි කිරීම් අතරමග නවතා දමා තිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් ඉදි කිරීම් කටයුතු නැවත ආරම්භ කර නොතිබුණි.	නොනිමි ඉදිකිරීම් සඳහා විශාල පිරිවැයක් දැරීමට සිදු වන නිසා ආයතනයේ මූල්‍ය තත්වය අනුව සහ ප්‍රමුඛතාවය මත වැඩ ආරම්භ කර අවසන් කිරීමට බලාපොරොත්තු වන අතර මෙම සියළු ඉදිකිරීම් වලට අදාල සැලසුම් ඇස්තමේන්තු ඇති අතර විගණනය සඳහා ඉදිරිපත් කරන බව.	විධිමත් පරිදි කටයුතු කර ඉදිකිරීම නිම කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	ගොල්ෆ් ක්‍රීඩාංගනය සඳහා අත්තිකාරම් ලෙස 2023 වර්ෂයේ රු.250,000 ක මුදලක් ගෙවා තිබූ අතර, විගණිත දින වන විටත් ක්‍රීඩාංගනයේ කටයුතු ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ අප්‍රේල් 08 දින ගෘහ භාණ්ඩ අත්තිකාරම් වශයෙන් රු.250,000 ක මුදලක් සැපයුම්කරුට ගෙවා තිබුණද, 2025 අප්‍රේල් 30 දින වන විටත් භාණ්ඩ සපයාගෙන නොතිබුණි.	ඉදිරි කාලයේදී ආයතනයේ මූල්‍ය තත්වය මත වැඩ ආරම්භ කිරීමට කටයුතු කිරීමට බලාපොරොත්තු වන බව.	විධිමත් පරිදි කටයුතු කර ව්‍යාපෘතිය නිම කර ගැනීමට පියවර ගත යුතුය.
(ඇ)	ප්‍රමිතියෙන් යුත් SLS සහතිකය සහිත පෙරසවි ගල් මහනුවර අවටින් නිෂ්පාදනය කරන ආයතන පැවතියදී සමාලෝචිත වර්ෂයේදී කඩුවෙල සිට අම්බුළුවාව දක්වා පෙරසවි ගල් ප්‍රවාහනය කරවාගෙන පෞද්ගලික ආයතනයකට රු.320,000 ක ගෙවීම් කර තිබුණි.	SLS ප්‍රමිතිය තිබෙන පෙර සවි ගල් අප අවට ඇති නමුත් N90 තෙරපුමක් (දැඩි බරක්) යෙදීමට යෝග්‍ය නොවන නිසා පිළිගත් ආයතනයකින් ලබා බව.	විධිමත් පරීක්ෂාවක් සිදු කර අරපිරිමැස්මෙන් තොරව වියදම් දරා ඇති නිලධාරීන් සම්බන්ධ පියවර ගත යුතුය.
(ඈ)	වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම හා පවත්වා ගෙන යාම සඳහා රු.880,000 ක් පෞද්ගලික ආයතනයක් වෙත ගෙවා තිබුණද, එම ආයතනය තෝරා ගැනීමේ පදනම හා ප්‍රසම්පාදන ක්‍රියාවලියට අදාළ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	දක්ෂතාවය හා හැකියාව හා මිල ගණන් අඩු බැවින් ප්‍රචාරක කටයුතු සඳහා භාරකාර මණ්ඩලයේ අනුමැතිය අනුව එම ආයතනය ප්‍රචාරක කටයුතු සඳහා යොදාගන්නා ලද බව.	විධිමත් ප්‍රසම්පාදන ක්‍රමවේදයක් යටතේ ආයතනය තෝරා ගැනීමට කටයුතු කළ යුතුය.
(ඉ)	පෞද්ගලික ආයතනයක් වෙත රු.1,459,000 ක් ගෙවා RN 125 ට්‍රැක්ටරය හා කැලෑ කැපීමේ යන්ත්‍රයක් මිලදී ගෙන	ආයතනයෙන් ලබා ගන්නා ලද ට්‍රැක්ටරය ශ්‍රී ලංකාව තුළ අලෙවි කරන එකම නියෝජිතයා වන	විධිමත් පරීක්ෂාවක් සිදු කර අවිධිමත් පරිදි ප්‍රසම්පාදන

ඇතත්, මිල කැඳවීම් ලිපි, ප්‍රසම්පාදන තීරණ, භාණ්ඩ ඇණවුම් හා ලැබීම් තුණ්ඩු බිල්පත් හා තොග ලේඛන විගණනයට ඉදිරිපත් නොවූ අතර, පී.සී.60 එක්ස්කැවේටර් යන්ත්‍රය අළුත්වැඩියාව සඳහා සමාලෝචිත වර්ෂය තුලදී රු.736,550 ක් ගෙවීම් කර ඇතත්, මෙම ආයතනය තෝරා ගැනීම පිළිබඳව ප්‍රසම්පාදන තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	නිසා එම ආයතනයෙන් මෙම යන්ත්‍රය මිලදී ගැනීමට තීරණය කළ අතර මුදල් ගෙවීමේ බිල්පත සහ මිල විමසුම ඉදිරිපත් කරන බව.	කටයුතු කළ නිලධාරීන්ට විධිමත් පියවර ගත යුතුය.

3.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2023 ජූනි 10 දින පවත්වන ලද භාරකාර මණ්ඩල රැස්වීමේදී රුපියල් බිලියන 1.2 ක ඇස්තමේන්තුවක් අනුව කේබල් කාර් ව්‍යාපෘතියක් කිරීමටත්, එය ඉදිකර පවත්වාගෙන යාමට වෙනමම සමාගමකට බදු දීමටත්, ඇස්තමේන්තු මුදලින් සියයට 16 ක් භාරය විසින් දැරීමටත් තීරණය කර තිබූ අතර, ප්‍රසම්පාදන කැඳවීමකින් තොරව, භාරකාර මණ්ඩල රැස්වීම පවත්වා දින 06 කට පසු එනම් 2023 ජූනි 16 දින ලියාපදිංචි කළ සමාගමක් සමඟ ව්‍යාපෘතිය ඉටු කිරීමට ගිවිසුම්ගත වී තිබුණි. එම ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂය තුලදී වවුචර් 19 ක් මගින් එකතුව රු.93,151,217 ක් වැයකර තිබුණු අතර, එය කුමන කාර්යයකටද යන්න සනාථ කර ගැනීමට ගෙවීම් වවුචරය සමඟ උපලේඛන විගණනයට ඉදිරිපත් නොවීය. කේබල් කාර් ව්‍යාපෘතියේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා රු.250,360,000 ක ඇස්තමේන්තුවක් පිළියෙල කර එයින් සියයට 37 ක මුදලක් මේ වන විට භාරයෙන් දරා තිබුණි.	අම්බුළුවාව ජෛව විවිධත්ව සංකීර්ණයේ කේබල් කාර් ව්‍යාපෘතියේ ඇස්තමේන්තු වටිනාකම රු.1,201,085,429 වන අතර අරමුදල විසින් ආයෝජනය කර ඇති කොටස ගිවිසුමට අනුව සියයට 14 වේ. ඉන් 2024 වර්ෂයට අදාල මුදල පමණක් දැනට ආයෝජනය කර ඇති බව.	මෙම ව්‍යාපෘතිය සම්බන්ධ විධිමත් පරීක්ෂණයක් පවත්වා අවිධිමත් පරිදි කටයුතු කළ පාර්ශව වෙත පියවර ගැනීමටත්, ව්‍යාපෘතිය විධිමත් කිරීමටත් පියවර ගත යුතුය.
(ආ)	සංකීර්ණයේ පිහිටි කුළුණට පිවිසෙන මාර්ගයේ ඇති පිපිරීමක් සම්බන්ධයෙන් භූ විද්‍යාත්මක පරීක්ෂණයක් ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයෙන් සිදුකර ගැනීමෙන් තොරව රු.75,000 ක මුදලක් සිවිල් ඉංජිනේරුවරයෙකු වෙත	මෙම ගෙවීම කුළුණේ තත්වය පිළිබඳ පරීක්ෂාවක් සඳහා නොවන අතර කුළුණට පිවිසෙන මාර්ගයේ ඇති පිපිරීම සම්බන්ධයෙන් භූ විද්‍යාත්මක පරීක්ෂණයක් සඳහා	විධිමත් පරීක්ෂාවක් සිදු කර නිෂ්කාර්ය වියදම අදාළ පාර්ශව වෙතින් අයකර ගත යුතුය.

	ගෙවීම් කර ඉංජිනේරුවරයාගෙන් ලද උපදෙස් පරිදි, නැවත රු.58,279 ක් වැයකර ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයෙන් පරීක්ෂා කරවා ගෙන තිබුණි. ඒ අනුව පෙර ගෙවූ රු.75,000 ක මුදල නිෂ්කාර්ය වී තිබුණි.	වන අතර .එම දිනය (වර්ෂය) මුද්‍රණයේදි සිදු වූ දෝෂයක් බව.	
(ඇ)	අරමුදල ස්ථාපිත පනතේ අරමුණු අනුව මෙම සංකීර්ණය ආගමික මධ්‍යස්ථාන ආරක්ෂා කිරීම ආගමික සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම අරමුණු ලෙස හඳුනාගෙන තිබුණද, සමාලෝචිත වර්ෂය තුළ සංකීර්ණය ආශ්‍රිතව බියර් කවුන්ටරයක් ආරම්භ කිරීම වෙනුවෙන් වියදම් දරා තිබීමෙන් භාරයේ අරමුණට පටහැනිව කටයුතු කර තිබුණ බව නිරීක්ෂණය විය.	විදේශ සංචාරකයන්ගේ දැඩි ඉල්ලීම මේ සඳහා පවතින අතර අම්බුළුවාව ජෛව විවිධත්ව සංකීර්ණයේ අනන්‍යතාවයට හානියක් නොවන අයුරින් ඉදිකිරීම් කටයුතු සිදු කිරීම් කල යුතු නිසාත්, අපගේ අනන්‍යතාවය රැකගෙන මෙම පහසුකම් සංචාරකයින් වෙත ලබා දීමට අප විසින් කටයුතු කරන බවත් දැනට එම කටයුතු නවතා ඇති බවත් සංස්ථාපිත අරමුණු තුළද විනෝදාත්මක කටයුතු සඳහා යෙදවිය හැකි බව.	පනතේ අරමුණුවලට අනුකූලව කටයුතු කළ යුතු අතර, විධිමත් පරීක්ෂණයක් කර අරමුණට හානියක් වන පරිදි කටයුතු කළ පාර්ශව වෙත පියවර ගත යුතුය.
(ඈ)	2023 ජනවාරි 16 දින ප්‍රසම්පාදන කැඳවා ඊට මාස 07 කට පසු එනම්, 2023 අගෝස්තු 16 දින සමාගම් රෙජිස්ටාර් යටතේ ලියාපදිංචි කරන ලද සමාගමකට පරිගණක පද්ධතිය කළමනාකරණය කිරීම සඳහා පැවරීම් කර සමාලෝචිත වර්ෂය තුළ රු.20,010,057 ක මුදලක් ගෙවීම් කර තිබුණි.	එම ආයතනයේ මිළ ගණන් අනුව ආදායමින් සියයට 7.5 ක් ගෙවීමට එකගතාවය මත භාරකාර මණ්ඩල අනුමැතිය අනුව එම ආයතනය තෝරා ගන්නා ලද බව.	නිවැරදි ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටියෙන් බැහැරව කටයුතු කළ නිලධාරීන්ට පියවර ගත යුතුය.
(ඉ)	සමාලෝචිත වර්ෂය තුල දී අම්බුළුවාව සංකීර්ණය තුළ පොලිස් රාජකාරි සිදුකරන ලද පොලිස් නිලධාරීන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ සුභසාධන වියදම් ලෙස එකතුව රු.633,378 ක් අරමුදලින් ගෙවා තිබුණි.	පොලිස් රාජකාරි කරන අයගේ පවුල් වල සාමාජිකයින් සඳහා සුබ සාධන වියදම් ගෙවීම සඳහා භාරකාර මණ්ඩලයෙන් අනුමැතිය ලැබී ඇති බව.	අරමුදලේ අරමුණට පටහැනි ගෙවීම් නොකළ යුතු අතර, එසේ ගෙවීමට තීරණ ගත් පාර්ශව වෙත විධිමත් පියවර ගත යුතුය.

3.3 ප්‍රසම්පාදන කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුගමනය කිරීමකින් තොරව අවස්ථා 35 ක දී එකතුව රු.15,333,458 ක් වැයකර මිලදී ගැනීම් හා ඉදිකිරීම් සිදුකර තිබුණි.	ඔබ විසින් ඉල්ලීම් කරන ලද ප්‍රසම්පාදන ලිපි ගොනු පිළිතුර සමග ඉදිරිපත් කරන බව.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට පටහැනිව කටයුතු කළ පාර්ශව වෙත පියවර ගැනීමත්, ඉදිරියේදී නිවැරදි ප්‍රසම්පාදන ක්‍රියාවලියක් භාවිතා කිරීමටත්, පියවර ගත යුතුය.

4. ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය

4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15.1 ඡේදයේ ඇතුළත් මුදල් රෙගුලාසි 877(2) (ඈ) ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී මාස 02 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සමඟ කාර්ය සාධන වාර්තාව විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන දින 51 ක ප්‍රමාදයක් සහිතව 2025 අප්‍රේල් 21 දින ඉදිරිපත් කර තිබුණු අතර කාර්යසාධන වාර්තා ඒ සමඟ ඉදිරිපත් කර නොතිබුණි.	2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශණ 2025-04-21 දින ඉදිරිපත් කළ බවත්. කාර්යය සාධන වාර්තාව පිළිතුර සමග ඉදිරිපත් කරන බව.	මූල්‍ය ප්‍රකාශන සමග කාර්යසාධන වාර්තාව නියමිත කාල සීමාවේදී විගණනයට ඉදිරිපත් කළ යුතුය.

4.2 අයවැය පාලනය

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ආදායම් වියදම් ඇතුළත්ව විධිමත් අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණි.	ලේඛණය පිළිතුර සමග ඉදිරිපත් කරන බව.	විධිමත් අයවැය ලේඛනයක් පවත්වාගත යුතුය.